VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG


# පශ්චාත් යුධ සමයේ ජයග්‍රාහකයෝ : නාගරික ධනවතුන් ද ග්‍රාමීය දුප්පතුන්ද

රටක ආර්ථික කාර්ය සාධනය මැන බැලීමේදී සමස්ත ආදායම් වර්ධනය දෙස පමණක් නොව ආදායම බෙදී යන ආකාරය දෙසට ද සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු බව ආර්ථික විද්‍යාඥයින්ගේ අදහසයි. මේ සඳහා බලපෑ ප්‍රධාන සාධකය වන්නේ ආදායම් බෙදීයාමේ විෂමතාවය ඉහළ යාමත් සමග ආර්ථික සෞභාග්‍යට හා සමාජ ස්ථාවරත්වයට දැඩි පීඩනයක් එල්ල වන බවට ආර්ථික විද්‍යාත්මක පරීක්ෂණ මගින් තහවුරු කොට තිබීමයි.

එක්සත් ජනතා සන්ධානය මගින් ඉදිරිපත් කළ මහින්ද චින්තන ප්‍රතිපත්තිය ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුකිරීම සඳහා සුවිශේෂී අවධානයක් යොමු කළ ග්‍රාමීය සංවර්ධනය මූලික කරගත් සංවර්ධන ප්‍රතිපත්තියකි. එක්සත් ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කළ 'යළි පුබුදම ශ්‍රී ලංකා' ප්‍රතිපත්තිය හා සසඳන විට මෙම වෙනස පැහැදිලි වේ. එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය විසින් ඉදිරිපත් කරන ලද අයවැය කථාවන් මගින් දුප්පත් ජනතාවගේ අදායම් මට්ටම ඉහළට ගෙන ඒම හා ග්‍රාමීය සංවර්ධනය ඉහළ මට්ටමකට රැගෙන ඒමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන්ද නිරන්තරයෙන් කරුණු සඳහන් කරන ලදී. මේ සඳහා ඉදිරිපත් කළ වැඩසටහන අතර ගම නැගුම, ගැමි දිරිය, ගැමි පුබුදුව හා දිවි නැගුම කැපී පෙනේ.

මේ ආකාරයට ග්‍රාමීය සංවර්ධනය මුල් කරගත් රාජ්‍ය ප්‍රතිපත්තියක් ගොඩ නැගීම පිළිබඳව රජයට පැසසිය යුතු වන්නේ මිලියන 5.2ක් පමණ වන ශ්‍රී ලාංකික ගෘහයන්ගෙන් 79% ක පමණ ඉහළ ප්‍රතිශතයක් ග්‍රාමීය අංශයට අයත් වන බවට වර්ගීකරණය කොට ඇති බැවිණි (රූප සටහන 01).

රූප සටහන 01 : ශ්‍රී ලංකාවේ ගෘහස්ත ආදායම් ව්‍යාප්තිය



ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ගෘහාශ්‍රිත ආදායම් හා වියදම් සමීක්ෂණය 2012/13 මගින් ඉදිරිපත් කොට ඇති දත්ත මගින අනාවරණය වන යථාර්ථය රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් අපේක්ෂිත චිත්‍රයට වඩා වෙනස් මුහුණුවරක් ගෙන ඇත. පශ්චාත් යුධ සමය තුළ ළඟා කරගත් ඉහළ ආර්ථික අභිවෘද්ධියෙහි ප්‍රතිලාභ බෙදීගොස් ඇති ආකාරය විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ නාගරික අංශයට අයත් වන ගෘහයන් තම ආදායම් මට්ටම සැලකිය යුතු මට්ටමකින් වර්ධනය කරගනිද්දී ග්‍රාමීය සහ වතු අංශ වලට අයත් වන ගෘහයන්ගේ ආදායම් මට්ටම මන්දගාමී ලෙස වර්ධනය වන බවයි.

එපමණක් නොව ධනවත් සහ දුගී යන ආදායම් නිර්නාකයය මත පිහිටා දත්ත විශ්ලේෂණය සිදු කළ විට ද 'නාගරික-ග්‍රාමීය' ආදායම් වර්ධනය තුළ දක්නට ලැබෙන ආකාරයේම ආදායම් වර්ධන ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. එනම් දුගී ගෘහයන්ගේ ආදායම් වර්ධන වේගයට වඩා වැඩි වේගයකින් ධනවත් ගෘහයන්ගේ ආදායම් මට්ටම වර්ධනය වන බවයි.

මෙම විශ්ලේෂණය සඳහා ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද 2002, 2006/7, 2009/10 හා 2012/13 යන වසර වල ගෘහස්ත ආදායම් හා වියදම් සමීක්ෂණ වාර්තා දත්ත යොදාගෙන ඇති අතර මෙම ආදායම් මට්ටම් නාමික අගයන්ගෙන් සඳහන් කොට ඇත (එනම් උද්ධමනය සඳහා ගැලපුම් සිදු කර නොමැත). එම නිසා ආදායම් මට්ටම ඉහළ යන වේගයෙන්ම සැබෑ පරිභෝජන හැකියාව ද ඉහළ යන බවට නිගමනයකට එළඹීමට නොහැකිය.

**2002 සිට 2006/7 කාල පරාසය**

මෙම සමීක්ෂණ වාර්තා දත්ත සැසඳීමේදී පෙනී යන්නේ අදාල කාල පරාසයන් 4 තුළ ආදායම් මට්ටම වර්ධනයෙහි ඉහළම අගය මෙන්ම ග්‍රාමීය හා වතු අංශයන්ට අයත් ගෘහයන්ගේ ආදායම් වර්ධනයෙහි ඉහළම අගය ද 2002 - 2006/7 කාල පරාසය තුළ වාර්තා වූ බවයි (අංක සටහන 02). ප්‍රතිපත්තිමය දෘෂ්ඨිකෝණයකින් බැලීමේදී මෙය පොදු මතය අනුව වඩාත් නාගරික සංවර්ධනයක් අරමුණු කොටගෙන ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වූ කාල පරාසයකි. එනමුත් ග්‍රාමීය හා නාගරික අංශයන්ට අයත් ගෘහයන් පිළිවෙලින් 15.92% හා 18.43% වැනි ඉහළ අගයකින් 2002 - 2006/7 කාල පරාසය තුළ සිය වාර්ෂික ආදායම් මට්ටම වර්ධනය කර ගැනීමට සමත් විය.

| අංක සටහන 01: සාමාන්‍ය ගෘහස්ත ආදායමේ වාර්ෂික වර්ධන වේගය % | | | | ගෘහයන් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| | 2002 සිට 2006/7 දක්වා | 2006/7 සිට 2009/10 දක්වා | 2009/10 සිට 2012/13 දක්වා | |
| ශ්‍රී ලංකාව | 15.99 | 11.78 | 9.19 | 100 |
| නාගරික අංශය | 14.37 | 2.52 | 13.94 | 17 |
| ග්‍රාමීය අංශය | 15.92 | 14.32 | 7.11 | 79 |
| වතු අංශය | 18.43 | 17.72 | 7.54 | 4 |


මූලාශ්‍රය : ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

**2006/7 සිට 2009/10 කාල පරාසය**

මෙම කාල සීමාව තුළ නාගරික ගෘහස්ත වල ආදායම් වර්ධනය 2.52%ක් වැනි ඉතා අඩු අගයක් වාර්තා කළ නමුත් ග්‍රාමීය සහ වතු අංශයන් ඉහළ වාර්ෂික ආදායම් වර්ධන වේගයක් වාර්තා කිරීමට සමත් විය. එසේම 2006/7-2009/10 යන සම්පූර්ණ කාල පරාසය තුළ ග්‍රාමීය අංශය 49% ක හා වතු අංශය 62% ක සාමාන්‍ය ආදායම් වර්ධන වේගයක් අත් කර ගැනීමට සමත් වෙද්දී නාගරික අංශයේ වර්ධනය වූයේ 8%ක් වැනි කුඩා ප්‍රතිශතයකි (රූප සටහන 02).

**2009/10 සිට 2012/13 කාල පරාසය**

පශ්චාත් යුධ කාලය තුළ ගෘහස්ත වාර්ෂික ආදායම් වර්ධනය දෙස අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ එය මන්දගාමී මුහුණුවරක් ගෙන ඇති බවයි. කෙසේ වුවද නාගරික අංශයට අයත් ගෘහයන් 2009/10 සිට 2012/13 කාල සීමාව තුළ සිය ආදායම 48%කින් පමණ වර්ධනය කර ගැනීමට සමත් වෙද්දී ග්‍රාමීය හා වතුකර අංශයන්ට අයත් ගෘහයන් පිළිවෙලින් 23% ක හා 24% ක නාමික ආදායමෙහි වර්ධනයක් ළඟා කර ගැනීමට සමත් විය. (රූප සටහන 02).




මීට සමාන උපනතියක් ගෘහස්ත වියදම් රටාව තුළ ද විද්‍යාමාන වේ. 2002 සිට 2009 කාල පරාසය තුළ ග්‍රාමීය හා වතු අංශ වලට ගෘහස්ත වියදමෙහි වර්ධනය නාගරික අංශය අභිබවන ලදී. නමුත් 2009/10 සිට 2012/13 දක්වා කාලය තුළ නාගරික ගෘහස්ත වියදම 32% කින් වර්ධනය වෙද්දී ග්‍රාමීය හා වතු අංශ වල ගෘහස්ත වියදම පිළිවෙලින් 22% හා 16% වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

2002 සිට 2009/10 කාල පරාසය තුළ ග්‍රාමීය හා වතු අංශ වලට අයත් ගෘහයන් සිය ආදායම් මට්ටම සැලකිය යුතු ඉහළ ප්‍රතිශතයකින් වර්ධනය කර ගැනීමට සමත් වුවද ජනගහණයෙන් අඩුම ආදායම් ලබන 10% ක ජන කොටසට සමස්ත ආදායමෙන් හිමි ප්‍රතිශතය මෙම කාල පරිච්ඡේදය තුළ වෙනස් වීමකට භාජනය වී නොමැත. 2002 සිට 2009/10 කාල පරාසය තුළ 1.7% පමණ අගයක නොවෙනස්ව පැවති මෙම ප්‍රතිශතය 2012 වන විට 1.4% දක්වා පහත වැටුණි. කෙසේ වුවද මීට ප්‍රතිවිරෝධී ලෙස ඉහළම ආදායම් ලබන 10% ක ජන කොටස සමස්ත ආදායමෙන් තමන් සතු කොට ගත් ආදායම් ප්‍රතිශතය 2009 දී 36.9% මට්ටමේ සිට 38.7% දක්වා වර්ධනය කර ගැනීමට සමත් විය.

ආදායම් බෙදීයාමේ විෂමතාවය පිළිබඳ මිනුමක් වන ගිනි සංගණකය මගින් ද මෙම කරුණු සනාථ කොට ඇත. 1981 සිට 2005 දක්වා කාලය තුළ ගිනි සංගණකය 0.43 සිට 0.47 දක්වා ඉහළ යන ලදී. එමෙනම් ග්‍රාමීය සහ වතු අංශ වල ගෘහයන් ඉහළ ආදායම් වර්ධනයක් පෙන්නුම් කළ 2002-2009 කාල පරිච්ඡේදය තුළ ගිනි සංගණකය 0.47 සිට 0.49 දක්වා ඉහළ යමින් ආදායම් බෙදීයාමේ විෂමතාවයෙහි වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද මෙම දත්ත වල අඩුලුහුඩුකම් ගණනාවක් ඇත. ඉන් ප්‍රධාන ගැටළුව වන්නේ 2012/13 සමීක්ෂණයට පෙර සිදු කළ සමීක්ෂණ මගින් සමස්ත දිවයිනම ආවරණය නොවීමයි. උදාහරණයක් ලෙස 2009/10 සමීක්ෂණය මගින් උතුරු පළාතට අයත් මන්නාරම, කිලිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්ක ආවරණය නොවූ අතර 2006/7 සමීක්ෂණය මගින් උතුරු පලාතම හා නැගෙනහිර පළාතට අයත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ආවරණය නොවිය. එමෙන්ම 2002 සමීක්ෂණය මගින් සමස්ත උතුරු පළාත හා නැගෙනහිර පළාත ආවරණය නොවිය. මෙම වෙනස්කම් සලකා බලා විශ්ලේෂණය දෙස බැලීමේදී සමස්ත ප්‍රතිඵලයට සැලකිය යුතු වෙනසක් සිදුවෙතැයි අපේක්ෂා කළ නොහැක. ඊට හේතුව 2009/10 හා 2012/13 සමීක්ෂණයන් අතර එකම වෙනස මුලතිව්, කිලිනොච්චි හා මන්නාරම යන සමස්ත ජනගහණයෙන් 1.6% ක පමණ සුළු ජනගහණ ප්‍රතිශතයකට හිමිකම් කියන දිස්ත්‍රික්ක 2009/10 සමීක්ෂණය ආවරණය නොවීමයි.

මෙම විශ්ලේෂණයෙන් අණාවරණය වන විස්මය දනවන නිගමනය වන්නේ ග්‍රාමීය සංවර්ධනය කේන්ද්‍රකොටගෙන ක්‍රියාත්මක වූ මහින්ද චින්තන ප්‍රතිපත්තියෙන් අපේක්ෂිත ග්‍රාමීය සංවර්ධනය යුද්ධය පැවති කාල වකවානුවට සාපේක්ෂව යුද්ධයෙන් පසු අවධියේදී පසුගාමී මුහුණුවරක් ගැනීමයි. එනම් පශ්චාත් යුධ සංවර්ධනයේ ජයග්‍රාහකයින් ග්‍රාමීය දුප්පතුන් නොව නාගරික ධනවතුන් අංශය බවයි.

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**